# ප්‍රවෘත්ති නිවේදනය

## "ජුනි මස උද්ධමනය 6.3% දක්වා පහළ යයි"

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2017 ජුනි

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

**දුර: 011-2147414** **ෆැක්ස්: 011-2877945** **ඊමේල්: prices@statistics.gov.lk**

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිවේදනය කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා 2017 මැයි මාසයේ 7.1%ක් වූ වාර්ෂික උද්ධමනය 2017 ජුනි මාසයේ 6.3%ක් දක්වා අඩුවූ බව ප්‍රකාශ කලේය. 2017 ජුනි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 3.9%ක හා ආහාර නොවන කාණ්ඩයේ 2.4%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2016 ජුනි මාසයේ උද්ධමනය සඳහා මෙම එක් එක් කාණ්ඩයේ දායකත්වය පිළිවෙලින් 3.4%ක් හා 3.1%ක් විය.

කෙසේ නමුත් 2017 ජුනි මාසයේ ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කළවිට, 2017 මැයි මාසයේ දර්ශකය 121.8 සිට 2017 ජුනි මාසයේ දර්ශකය 123.4 දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කල විට 2017 ජුනි මාසයේ මෙම වැඩිවීම 1.6ක දර්ශකාංක වැඩිවීමක් හා 1.3ක ප්‍රතිශතාංක වැඩිවීමක් ලෙස වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 1.30%කින් වැඩිවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.03%කින් වැඩිවීම බලපා ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා සහල්, එළවළු, අළුත් මාළු, කරවල, කුකුල් මස්, රතුළූණු, අමු මිරිස්, තේ කොළ, දෙහි සහ සුදුළූණු යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීම බලපා ඇත. එසේ වුවත් පොල්, පොල් තෙල්, බිත්තර, ලොකු ළූණු, කෙසෙල්, පැපොල්, සහ සියඹලා යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සසඳන කල 2017 ජුනි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'විවිධ භාණ්ඩ හා සේවා', 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' සහ 'රෙදිපිළි හා පාවහන්' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. එසේ වුවත් 2017 මැයි මාසය හා සංසන්දනය කළවිට 'සෞඛ්‍ය' කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවී ඇත. 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', 'ප්‍රවාහන', 'සන්නිවේදන, 'විනෝදාත්මක හා සංස්කෘතික', 'අධ්‍යාපන' සහ 'ආපනශාලා හා හෝටල්' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම නොවෙනස්ව පැවතුණි.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | මිල දර්ශකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | වාර්ෂික උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2016** | ජුනි | 116.1 | 2.1 | 6.4 |
| | ජූලි | 115.2 | -0.8 | 5.8 |
| | අගෝස්තු | 113.3 | -1.6 | 4.5 |
| | සැප්තැම්බර් | 113.5 | 0.2 | 4.7 |
| | ඔක්තෝම්බර් | 114.7 | 1.1 | 5.0 |
| | නොවැම්බර් | 116.6 | 1.7 | 4.1 |
| | දෙසැම්බර් | 118.0 | 1.2 | 4.2 |
| **2017** | ජනවාරි | 119.3 | 1.1 | 6.5 |
| | පෙබරවාරි | 119.9 | 0.5 | 8.2 |
| | මාර්තු | 119.5 | -0.3 | 8.6 |
| | අප්‍රේල් | 121.0 | 1.3 | 8.4 |
| | මැයි | 121.8 | 0.7 | 7.1 |
| | ජුනි | 123.4 | 1.3 | 6.3 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව